කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී විශේෂ උපාධි තෙවන වසර පරීක්ෂණය
පළමු සෙමෙස්තරය 2021/2022
**SLG 3160** - සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ අධ්‍යයනය
(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට **(03)** පමණක් පිළිතුරු සපයන්න.

---

1. "සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ විග්‍රහයේ තීරණාත්මක කෘතියක් ලෙස 'සිදත් සඟරාව' සැලකිය හැකි ය" යන්න ප්‍රමාණ කොට සිදත් සඟරාවේ නිරූපිත ව්‍යාකරණ විග්‍රහය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක යෙදෙන්න.

2. "සිදත් සඟරාවේ වර්ණමාලාව තත්කාලීන භාෂාවේ වර්ණමාලාවට වඩා වෙනස් නමුත් ශබ්ද විද්‍යාත්මක වශයෙන් වැදගත් පරිණාමීය ලක්ෂණ ප්‍රකට කරයි" යන්න සනිදර්ශනව විග්‍රහ කරන්න.

3. "සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයේ ව්‍යුහාත්මක වැදගත්කමක් සිදත් සඟරාවේ සංඥාධිකාරයෙන් (සන් අදියර) ප්‍රකට වේ". මෙම කියමන සිදත් සඟරාවේ සන් අදියර ප්‍රමාණ කොට විමසන්න.

4. සිංහල භාෂාවේ ලිංග භේදය පිළිබඳ ව්‍යාකරණමය විග්‍රහය වඩාත් විවාදාපන්න තලයකට ගෙන ඒමට සිදත් සගරාවේ ලිංගාධිකාරය (ලිඟු අදියර) සමත් වූ ආකාරය සිදත් සඟරාව සහ මහාචාර්ය පී.බී.මීගස්කුඹුර මහතාගේ අදහස් තුලනය කරමින් විමසන්න.

5. සිංහල නාම වරනැඟීමේ දී භාවිත වන සචේතන - අචේතන භේදය ඓතිහාසිකව පැවතෙන්නක් බව සිදත් සඟරාවේ විභක්ත්‍යාධිකාරය (විබත් අදියර) ප්‍රමාණ කොට විග්‍රහයක යෙදෙන්න.

6. සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය සිදත් සඟරාවේ සිට වර්තමානය දක්වා ක්‍රමිකව වර්ධනය වූ සම්ප්‍රදායක් බව සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයේ ඉතිහාසය ඇසුරෙන් විමසන්න.